(52)

II/a (a-f)

(1)

## ලංකා සමසමාජ පක්ෂයේ

# ව්‍යවස්ථාව

# සිව්වැනි අන්තර් ජාතිකයේ කොටසක්වූ
# ලංකා සමසමාජ පක්ෂයේ
# ව්‍යවස්ථාව

(1) <u>නාමය:-</u> "ලංකා සමසමාජ පක්ෂය"

(2) <u>අන්තර් ජාතික සංවිධානයන්ට ඇති සම්බන්ධකම්:-</u>

(අ) ලංකාවේ දේශීය කොටස වශයෙන් මෙම පක්ෂය සිව්වැනි අන්තර් ජාතිකයට සම්බන්ධවේ.

(ආ) මෙම සම්බන්ධකමට අනුකූලව, එම අන්තර් ජාතිකයේ ක්‍රියා මාර්ගය හා අණපනත් මෙම පක්ෂය පිළිගනී. එහි පාලක මණ්ඩලය විසින් කලින් කල ගන්නට යෙදෙන තීරණවලට ද මෙම පක්ෂය යටත්වේ.

(3) <u>අරමුණු සහ පරමාර්ථ:-</u>

(අ) පක්ෂයේ අරමුණු හා පරමාර්ථයන් වනුයේ තම ක්‍රියා මාර්ග යෙහි සඳහන් කරන ලද කරුණු වෙති.

(ආ) පක්ෂයේ ක්‍රියා මාර්ගය සංශෝධනය කළ හැක්කේ හෝ වෙනස් කළ හැක්කේ පක්ෂයේ සම්මේලනයක කරනු ලබන තීරණයන් පිට පමණකි.

(ඇ) පක්ෂයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අදාල වන හැම දෙයක්ම පක්ෂයේ කටයුතුවලට ඇතුලත් වේ.

(4) <u>සාමාජිකත්වයේ කොන්දේසි:-</u>

(අ) පක්ෂයට ඇතුල්වන විට හා ඉන් පසුවත් සියළුම පාක්ෂික සහ අපේක්ෂකයන් විසින් මෙම කොන්දේසි සියල්ලම පිළිපැදිය යුතුවේ.

i පක්ෂයේ ක්‍රියා මාර්ගය පිළිගැනීම.

ii පක්ෂයේ ලෝකල් සභාවක, කණ්ඩායමක හෝ පක්ෂයේ වෙනත් මණ්ඩලයක, ක්‍රියාකාරී සාමාජික යෙකු මෙන් පක්ෂයේ වැඩකටයුතු වලට මධ්‍යම කාරක සභාව පිළිගන්නා ප්‍රමාණයකට සහභාගිවීම

iii පක්ෂයේ අරමුදල සඳහා මාස්පතා සාමාජික මුදලක් ගෙවීම එම සාමාජික මුදල කොතරම් විය යුතුද යන්න මධ්‍යම කාරක සභාව විසින් හෝ ප්‍රාදේශීය මණ්ඩලයක් විසින් හෝ ඒ ඒ පාක්ෂිකයාගේ ගෙවීමේ ශක්තියේ හැටියට නියම කරනු ලැබේ.

iv අන්තර් ජාතිකය වෙනුවෙන් අවුරුදු පතා රු: 1/50 ක් ගෙවීම.

(ආ) පක්ෂයට පාක්ෂිකයින් ඇතුල් කරවීමේ සම්පූර්ණ බලය ඇත්තේ මධ්‍යම කාරක සභාවට පමණි.

(5) <u>අපේක්ෂකයන් පත් කර ගැනීම:-</u>

පක්ෂයට ඇතුලත් වූ අපේක්ෂකයන් ඒ ඇසිල්ලේම පුහුණුව ලබන සාමාජිකයන් හැටියට ලෝකල් සභාවකට හෝ 10 (ආ) වගන්තිය අනුව මධ්‍යම කාරක සභාව විසින් වෙනත් මණ්ඩලයකට හෝ පත් කරනු ලැබේ.

(6) <u>අපේක්ෂකයන්ගේ අයිතිවාසිකම්:-</u>

පහත සඳහන් අයිතිවාසිකම් හැර ස්ථිර පාක්ෂිකයන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් සියල්ලක්ම අපේක්ෂකයනට ඇත්තේය එම නැති අයිතිවාසිකම් මේවාය:-

(1) කිසිම ප්‍රශ්නයකදී ඡන්දය පාවිච්චි කිරීමට ඔවුන්ට අයිතියක් නැත.

(ii) ලෝකල් සභාවක නිලධාරියෙකු හැටියට හෝ පක්ෂයේ පාලක මණ්ඩලයක සාමාජිකයෙකු හැටියට හෝ ඔවුන් පත් කළ නොහැක.

(iii) පක්ෂයේ සම්මේලනයකට නියෝජිතයන් වශයෙන් ඔවුන් පත්කළ නොහැක.

(iv) පක්ෂයේ සියළු රහස් කටයුතු වලින් ඔවුන් බැහැර කරනු ලැබේ. එහෙත් කිසියම් විශේෂ කරුණු සලකා මධ්‍යම කාරක සභාව විසින් මීට වෙනස්ව තීන්දු කළ හැක.

(7) ඕනෑවිටක මධ්‍යම කාරක සභාවට අපේක්ෂකයන් එක වර
ට ම පක්ෂයෙන් අස්කළ හැක.

(8) <u>අපේක්ෂකයන් පාක්ෂිකයන් වශයෙන් පත් කිරීම.</u>

කිසිම අපේක්ෂකයෙකු දොලොස් මසකට වඩා, පුහුණුවීමේ කාලයක් ගෙවීමට, තබා ගනු නොලැබේ.

(9) <u>පාක්ෂිකත්වයේ සභාන්දේසි ක්‍රියාවේ යෙදවීම.</u>

(අ) පක්ෂයේ ක්‍රියා මාර්ගය පිළිගැනීම සම්බන්ධ වූ 4 (1) යන වගන්තිය යම් පාක්ෂිකයෙකු විසින් උල්ලංඝනය කරන ලද්දේ නම් මධ්‍යම කාරක සභාවට ඔහු වහාම පක්ෂයෙන් බැහැර කළ හැකිය.

(ආ) 4 වැනි වගන්තියේ සඳහන් කරන ලද සාමාජිකත්වය සම්බන්ධ වූ අන් කිසි කොන්දේසියක් යම් පාක්ෂිකයෙකු විසින් උල්ලංඝනය කරන ලද්දේ නම් ඔහු වහාම අපේක්ෂකත්වයට පමුණුවන්ට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

(10) <u>පක්ෂයේ මූලික සංවිධාන:-</u>

(අ) පක්ෂයේ මූලික සංවිධානය ලෝකල් සභාවයි.

(ආ) පක්ෂයේ හැම පාක්ෂිකයෙකුම ද අපේක්ෂකයෙකුම ද මධ්‍යම කාරක සභාව වෙන නියමයක් නො කරන්නේ නම් ලෝකල් සභාවක සාමාජිකයෙකු විය යුතුයි.

(11) <u>ලෝකල් සභා:-</u>

(අ) මධ්‍යම කාරක සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේක නියමය අනුව එම සභාවලට යෝග්‍ය යැයි හැඟෙන ආකාරයට ලෝකල් සභා පිහිටුවනු ලැබේ.

(ආ) යටත් පිරිසෙයින් පාක්ෂිකයන් තුන්දෙනෙකුගෙන් ද මධ්‍යම කාරක සභාව හෝ ප්‍රාදේශීය සභාවක් මගින් ඇතුල් කරන ලද අපේක්ෂකයන්ගෙන්ද ලෝකල් සභාවක් සංයුක්ත විය යුතුයි.

(ඇ) හැම ලෝකල් සභාවකටම අයත් කටයුතු, කලින් කලට මධ්‍යම කාරක සභාව හෝ ප්‍රාදේශීය සභාව විසින් හෝ පැහැදිලි කරනු ලැබේ.

(ඈ) අඩු ගණනේ මසකට වරක් ලෝකල් සභා රැස්වීමක් පැවැත්විය යුතුය. එම රැස්වීම් වලදී තම සාමාජිකයන්ගේ වැඩ

කටයුතු විවේචනය කිරීමද මධ්‍යම කාරක සභාව හෝ ප්‍රාදේශීය සභාව මගින් නිකුත් කරන ලද දන්වීම් සහ අණ-පනත් සලකා බැලීමද කළ යුතුය.

(ඉ) හැම ලෝකල් සභාවක්ම ලේකම් කෙනෙකු තෝරා පත් කළයුතුය.

(ඊ) කාර්මික කම්කරුවන් වූ පාක්ෂිකයන් සහ අපේක්ෂකයන් ඔවුන්ගේ කර්මාන්ත ශාලාවට හෝ කර්මාන්තයට සම්බන්ධ ලෝකල් සභාවට සිරිතක් වශයෙන් ඇතුලත් වෙති. එබදු පාක්ෂිකයන් ප්‍රදේශවල වැඩ සඳහා පළාත් ලෝකල් සභා වලටත් සම්බන්ධ කිරීමට පුළුවන. පළාතේ ලෝකල් සභාවලට අයත් කාර්මික කම්කරු අපේක්ෂක හා පාක්ෂිකයන් ඔවුන්ගේ කර්මාන්තශාලාවට හෝ කර්මාන්තයට සම්බන්ධ ලෝකල් සභාවලට සම්බන්ධ කිරීම කළ යුතුය.

(12) ප්‍රාදේශීය සභාව:-

(අ) ප්‍රදේශය විග්‍රහ කිරීම ප්‍රාදේශීය සභාව විසින් කරනු ලැබේ
(ආ) මෙසේ විග්‍රහ කරන ලද ප්‍රාදේශිකයට අයත් පාක්ෂිකයන් වර්ෂයකට වරක් රැස්වී ප්‍රාදේශීය කොමිටියක් පත්කළ යුතුය. එම ප්‍රාදේශීය කොමිටිය එම ප්‍රදේශයේ පාක්ෂික වැඩ වලට වගකිව යුතුය.

(13) මධ්‍යම කාරක සභාව:-

(අ) පක්ෂයේ සම්මේලන වාරය අතරතුරේ ඇති උසස්ම මණ්ඩලය වන මධ්‍යම කාරක සභාව පක්ෂයේ ක්‍රියා මාර්ගය ව්‍යවස්ථාව සහ සම්මේලන තීරණයන් අනුව පක්ෂයේ වැඩට මග පෙන්විම ද පක්ෂයේ ක්‍රියා පරිපාටිය නියම කිරීමට ද වග කිව යුතුය.

(ආ) පක්ෂයේ සම්මේලනයක් මගින් තෝරා පත්කර ගනු ලබන මධ්‍යම කාරක සභාව මෙසේ යුක්ත විය යුතුය.
සාමාජිකයන් 41 දෙනෙක් සහ
500 වැඩි 1000දක්වා හැම පාක්ෂිකයන් 50 දෙනෙකුට එක් සාමාජිකයෙක් බැගින්ද

1000 ට වැඩි 2500 දක්වා සෑම පාක්ෂිකයන් 100 දෙනෙකුට 1ක් සාමාජිකයෙකු බැගින්ද,
2500 වැඩි 4900 දක්වා සෑම පාක්ෂිකයන් 150 දෙනෙකුට 1 සාමාජිකයෙකු බැගින්ද වශයේ යුක්ත විය යුතුය.
මධ්‍යම කාරක සභාවේ ඇතිවන ඕනෑම ඇබෑර්තුවකට කෙනෙකු පත්කර ගැනීමේ බලයද මධ්‍යම කාරක සභාවට තිබේ.

(ඈ) යම්කිසි අවස්ථාවකදී සාමාජිකයෙක් ඉල්ලා අස්වුවහොත් හෝ මළහොත් හෝ වෙන යම්කිසි කරුණක් නිසා බොහෝ කලකට මධ්‍යම කාරක සභාවේ කටයුතු කරන්නට නොහැකි නම් හෝ මධ්‍යම කාරක සභාවේ ඇබෑර්තුවක් ඇති වන්නේයයි සලකනු ලැබේ.

(ඈ) ක්‍රියාකාරි මණ්ඩලය විසින් පිළියෙල කරනු ලබන න්‍යාය පත්‍රයක් අනුව අඩු වශයෙන් තුන් මසකට වරක් වත් මධ්‍යම කාරක සභාව රැස්විය යුතුය. විශේෂ යෝජනාවක් හෝ ඉල්ලීමක් සාකච්ඡා කිරීමට ද මධ්‍යම කාරක සභාව රැස්විය යුතුය.

(ඉ) මධ්‍යම කරක සභා රැස්වීම් වලට ගණපූරණය එකි සාමාජික සංඛ්‍යාවෙන් භාගයකට වැඩි විය යුතුය.

**(14) පක්ෂයේ ලේකම්:-**

මධ්‍යම කාරක සභාව තම සාමාජිකයෙකු ලේකම් වශයෙන් පත් කරයි.

**(15) භාණ්ඩාගාරික:-**

(අ) මධ්‍යම කාරක සභාව තම සාමාජිකයෙකු භාණ්ඩාගාරික වශයෙන් පත් කරයි.

(ආ) එම භාණ්ඩාගාරික ඔහුට භාර කටයුතුවල කොටසක් වශයෙන් මාසික අය - වැය වාර්තාවක් ක්‍රියාකාරි මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.
එමෙන්ම වාර්ෂික සම්මේලනයට ඉදිරිපත් කිරීමට වාර්ෂික අය - වැය ලේඛණයක් පිළියෙල කළ යුතුය.

**(16) ක්‍රියාකාරි මණ්ඩලය:-**

(අ) දේශපාලන බියුරෝ සභාවේ සහ සංවිධායක බියුරෝ සභාවේ සියළු සාමාජිකයින් ඇතුළත් වන මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් ගෙන් 2/5 වැඩි නොවන 1/4 අඩු නොවන ගණනකින් යුක්ත ක්‍රියාකාරි මණ්ඩලයක් මධ්‍යම කාරක සභාව විසින් පත්කළ යුතුය.

නිවැරදි - ලේකම් යන [illegible]
සඳහන් [illegible]
ප්‍රධාන ලේකම් [illegible]

(ආ) මධ්‍යම කාරක සභාවේ පාලනය යටතේ මධ්‍යම කාරක සභා රැස්වීම් අතරතුර පක්ෂයේ වැඩ වලට මග පෙන්වීම සහ දේශපාලන වැඩ පිළිවෙල බේරුම් කිරීම ක්‍රියාකාරී මණ්ඩලය විසින් කළ යුතුය.

(ඇ) අඩුවශයෙන් මසකට වරක් සංවිධායක බියුරෝ සභාව විසින් පිළියෙල කරන න්‍යාය පත්‍රයක් අනුව ක්‍රියාකාරී මණ්ඩලය රැස්විය යුතුය.

(ඈ) ක්‍රියාකාරී මණ්ඩලයේ රැස්වීම් වලට ගණපූරණය එහි සාමාජික සංඛ්‍යාවෙන් බාගයකට වැඩිවිය යුතුය.

(17) (අ) අඩුවශයෙන් මධ්‍යම කාරක සභිකයන් තිදෙනෙකුගෙන් යුත් "සංවිධායක බියුරෝ සභාවක්" මධ්‍යම කාරක සභාව විසින් පත්කළ යුතුයි. දේශපාලන වැඩ පිළිවෙල හැර අනිකුත් කටයුතු සම්බන්ධව ක්‍රියාකාරී මණ්ඩලයේ රැස්වීම් අතර තුරේ දී ක්‍රියාකාරී මණ්ඩලයේ බලය හිමිවන මෙම බියුරෝ සභාව පක්ෂයේ එදිනෙදා වැඩවලට මග පෙන්විය යුතුය.

(ආ) මධ්‍යම කාරක සභිකයන් පස්දෙනෙකුට අඩු නොවූ ගණනකින් යුත් දේශපාලන බියුරෝ සභාවක් මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය. ක්‍රියාකාරී මණ්ඩලයේ රැස්වීම් අතරතුරේ දී පක්ෂයේ දේශපාලන වැඩ පිළිවෙල බේරුම් කරන මෙම බියුරෝ සභාවට එම දේශපාලන ප්‍රතිපත්ති සම්බන්ධව ක්‍රියාකාරී මණ්ඩලයේ රැස්වීම් අතරතුරේදී ක්‍රියාකාරී මණ්ඩලයේ බලය හිමිවේ.

(ඇ) වෘත්තීය සමිතිවල පක්ෂයේ එදිනෙදා වැඩ වලට මග පෙන්වීමට සහ ක්‍රියා කාරී මණ්ඩලයේ රැස්වීම් අතරතුරේ සංවිධායක බියුරෝ සභාවට සහ දේශපාලන බියුරෝ සභාවට බලය පැවරී ඇති කටයුතු හැර අන් කටයුතු පිළිබඳව ක්‍රියාකාරී මණ්ඩලයේ බලය ඇති වෘත්තීය සමිති බියුරෝ සභාවක් මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය.

(ඈ) කර්තෘ මණ්ඩලයක් මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය.

(ඉ) මධ්‍යම කාරක සභාවට අවශ්‍ය යයි කල්පනා කරන වෙනත් ඕනෑම මණ්ඩලයක් පත් කළ හැකිය.

(18) 17 වෙනි වගන්තිය අනුව පත්වන මණ්ඩලවල තීරණ වහාම ක්‍රියාවේ යෙදෙවෙනවා ඇත. එහෙත් එම තීරණ වෙනස් කළ යුතු ද නැතහොත් එකඟත්වය දැක්විය යුතු ද යන්න සලකා බලනු සඳහා ඊළඟ ක්‍රියාකාරී මණ්ඩලයේ සැලකිල්ලට ඒවා භාජන වෙනවා ඇත.

(19) **පාක්ෂික සම්මේලනය:-**

පාක්ෂික නියෝජිතයන්ගෙන් සමන්විත වූ පක්ෂයේ උත්තම මණ්ඩලය වන්නේ පක්ෂයේ සම්මේලනයයි. නියෝජිතයන්ගේ ගණන සහ පත් කරන ආකාරය මධ්‍යම කාරක සභාව විසින් නියම කළ යුතුය. සම්මේලනයේ තීරණ මුළු පක්ෂය විසින් අනුගමනය කළ යුතුවා පමණක් නොව එය වෙනස් කිරීම මතු සම්මේලනයකින් විනා කළ හැකි නොවේ. එහෙත් ඉතාමත්ම හදිසි හා වැදගත් කරුණක් සම්බන්ධව සම්මේලනයේ තීරණ යන් සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම මතු සම්මේලනය කින් විනා කළ හැකි නොවේ. එහෙත් ඉතාමත්ම හදිසි හා වැදගත් කරුණක් සම්බන්ධව සම්මේලනයේ තීරණයන් සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ ඊට ඉදුරාම පටහැනි තීරණයකට බැසීමට හෝ මධ්‍යම කාරක සභාවට බලය තිබේ. එහෙත් එවැනි අවස්ථාවලදී එකී තීරණ අනුමත කිරීමට ඉදිරිපත් කරනු පිණිස විශේෂ සම්මේලනයක් මධ්‍යම කාරක සභාව විසින් අප්‍රමාදව කැඳවිය යුතුයි.

20)

(අ) සම්මේලනයක් වුවමනාවූ විට කැඳවීම මධ්‍යමකාරක සභාව සතු කාර්යයකි.

(ආ) හැකි පමණට අවුරුද්දට වරක් පක්ෂයේ සාමාන්‍ය සම්මේලන යක් මධ්‍යම කාරක සභාව විසින් කැඳවිය යුතුය.

(ඇ) පහත සඳහන් අවස්ථා වලදී මධ්‍යම කාරක සභාව විසින් පක්ෂයේ විශේෂ සම්මේලනයක් කැඳවිය යුතුය.

**එම අවස්ථා නම්:-**

(1) 19 වෙනි වගන්තිය ප්‍රකාර විශේෂ සම්මේලනයක් කැඳවීමට අවස්ථාව මධ්‍යම කාරක සභාවට සැලසුනු විට.

(ii) විශේෂ සම්මේලනයක් කැඳවිය යුතුයයි මධ්‍යම කාරක සභාවේ අදහස වූ විට

(iii) පාක්ෂික සංඛ්‍යාවෙන් තුනෙන් පංගුවකට (1/3) වැඩි ගණනක් විසින්, විශේෂ සම්මේලනයක් විශේෂ කරුණක් හෝ කරුණු රැසක් සඳහා කැඳවන ලෙස ලිපියකින් ඉල්ලුම් කළ විට.

(21) එම ලිපිය ලැබී සතිත් පිරිසෙයින් මාස 3 ගතවන්නට ප්‍රථම එම විශේෂ සම්මේලනය මධ්‍යම කාරක සභාව විසින් කැඳවිය යුතුය ..

අ. පක්ෂයේ හැම සම්මේලනයක සියලු යෝජනා, වාර්තා ආදිය ඇතුලත්වූ වැඩ සටහන, සලකා බැලීම පිණිස, සියළුම ලෝකල් සභාවලට සම්මේලනයට පෙර යැවිය යුතුය.

ආ. පක්ෂයේ ඕනෑම සංවිධානයකට ඕනෑම පාක්ෂිකයෙකුට හෝ ඕනෑම අපේක්ෂකයෙකුට පක්ෂයේ සම්මේලනයේ කල්පනාවට භාජන කිරීම පිණිස යෝජනා ඉදිරිපත් කළ හැක. එවැනි හැම යෝජනාවක්ම මධ්‍යම කාරක සභාව විසින් පක්ෂයේ ඊළඟ සම්මේලන වාරයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතුය. එසේහත් එවැනි යෝජනාවක් සම්මේලනයක වැඩ සටහනට ඇතුළත් කිරීමට පෙර අඩු ගණනේ පාක්ෂිකයන් විසි පස් දෙනෙකුගේ අත්සන් ඒ වෙනුවෙන් තැබිය යුතුයයි ඉල්ලීමට මධ්‍යම කාරක සභාවට පුළුවන. තවද 20 (අ) වගන්තිය අනුව කැඳවනු ලබන විශේෂ සම්මේලනයක න්‍යාය පත්‍රය සහ එම සම්මේලනය කැඳවීමට ඇති විශේෂ හේතුවද සීමා කිරීමට මධ්‍යම කාරකසභාවට පුළුවන.

(22) <u>සාමාන්‍ය සම්මේලන:-</u>

අ. මධ්‍යම කාරක සභාව විසින් හැම සාමාන්‍ය සම්මේලනයකම වැඩ සටහනෙහි පහත සඳහන් දෑය ඇතුළත් කළ යුතුය.

එම කරුණු නම්:-

i සම්මේලනයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගතවූ සාමාන්‍ය සම්මේලනයේ පටන්, මධ්‍යම කාරක සභාවේ හා පක්ෂයේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක්;

ii සම්මේලනයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගතවූ සාමාන්‍ය සම්මේලනයේ පටන්, මධ්‍යම කාරක සභාවේ අය - වැය වාර්තාවක්;

iii සම්මේලනයේ විවේචනයට භාජන කිරීම පිණිස, ඉදිරියට පැමිණෙන කාලයේදී පක්ෂය ඉදිරිපිට තිබෙන දේශපාලන කර්තව්‍යයන් පිළිබඳ මධ්‍යම කාරක සභාවේ යෝජනාවක්;

iv සම්මේලනයේ විවේචනයට භාජන කිරීම පිණිස, ඉදිරියට පැමිණෙන කාලයේදී පක්ෂය ඉදිරිපිට තබන සංවිධායක කර්තව්‍යයන් පිළිබඳ යෝජනාවක්;

ආ. හැම සාමාන්‍ය සම්මේලනයකට අයත් අනෙක් කටයුතු හැර එම සම්මේලනය මගින් මධ්‍යම කාරක සභාවක් තෝරා පත් කළ යුතුයි.

(23) <u>මධ්‍යම කාරක සභාව තේරීම:-</u>

i සාමාන්‍ය සම්මේලනයක් විසින් මධ්‍යම කාරක සභාව මෙසේ තෝරා පත් කළ යුතුයි.

ii මධ්‍යම කාරක සභාවේ ගණන කොපමණ විය යුතු ද යන්න සම්මේලනය තීන්දු කර ගත යුතුය.

iii මධ්‍යම කාරක සභාවට නම් යෝජනා කිරීම ඕනෑම පාක්ෂිකයෙකුට කළ හැක.

iv යෝජනා කරන ලද නම් ගණන මධ්‍යම කාරක සභාවේ ප්‍රමාණයට වඩා වැඩිවුණු කල්හි උවමනාවන නියෝජිත ප්‍රමාණය සාමාන්‍ය වැඩි ඡන්ද ලැබීම අනුව තෝරා පත් කළ යුතුවේ.

(24) <u>විශේෂ සම්මේලන:-</u>

හැම විශේෂ සම්මේලනයකම න්‍යාය පත්‍රයේ පහත සඳහන් දේ ඇතුළත් විය යුතුයි.
එනම්:-

i මධ්‍යම කාරක සභාව විසින් සම්මේලනයට ඉදිරිපත් කරනු ලබන සියළුම කරුණු

ii ඕනෑම පාක්ෂිකයකු විසින් හෝ පක්ෂයේ සංවිධානයන් විසින් හෝ (ආ) වෙනි වගන්තිය අනුව විශේෂ සම්මේලනයට ඉදිරිපත් කරන ලද සියළුම යෝජනා

(25) <u>ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් සහ විනය:-</u>

''ඩෙමොක්‍රැටික්, සෙන්ට්‍රලිසම්' නොහොත් ''ජන සම්මත ඒකාග්‍රතාවය'' යන ප්‍රතිපත්තිය හෙවත් පක්ෂය තුල සාකච්ඡා කිරීමේ සම්පූර්ණ නිදහස හා ක්‍රියා කිරීමේ සම්පූර්ණ එකඟ කම පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් සහ විනය පාලනය කරයි.

(26) මධ්‍යම කාරක සභාවේ තීරණයන්ට සියළු පාක්ෂික සංවිධාන සහ සියළු පාක්ෂිකයන් හා අපේක්ෂකයන් බැදෙති.

(27) ප්‍රාදේශීය කාරක සභාවේ තීරණයන්ට එම ප්‍රාදේශිකයේ සියලු පාක්ෂිකයන් හා අපේක්ෂකයන් බැදෙති.

(28) ලෝකල් සභාවේ තීරණයන්ට ඒ ඒ ලෝකල් සභාවල සියළු පාක්ෂිකයන් හා අපේක්ෂකයන් බැදෙති.

(29) ලෝකල් සභාවල තීරණ වෙනස් කිරීමට මධ්‍යම කාරක සභාවට හෝ ප්‍රදේශීය මණ්ඩලයකට බලය තිබේ.

(30) යම් පාක්ෂිකයෙක් හෝ අපේක්ෂකයෙක් හෝ පක්ෂ මණ්ඩල-යක් හෝ තමා යටත් විය යුතු යම් තීරණයක් පිළි නො පදී නම් ඒ ඒ පාක්ෂිකයා හෝ පක්ෂ මණ්ඩලය පක්ෂයේ විනය කඩ කළාවේ.

(31) යම්පාක්ෂිකයෙක් අපේක්ෂකයෙක් හෝ පක්ෂමණ්ඩලයක් තමා යටත් විය යුතු යම් තීරණයක් සමග එකඟ නොවේනම් ඒ තීරණයට විරුද්ධ ඉල්ලීමක් ඊලඟ ඇති ඉහළ පාක්ෂික මණ්ඩලයට හා පාක්ෂික සම්මේලනයට ඉදිරිපත් කිරීමට තමාට බලය තිබේ. එහෙත් එම මුල් තීරණය වෙනස් වන තුරු ඊට යටත් විය යුතුයි.

(32) පක්ෂයේ සම්මේලනයේ හෝ මධ්‍යම කාරක සභාවේ හෝ වෙන යම් පාක්ෂික මණ්ඩලයක හෝ තීරණයක් පිළිබඳව තම අදහස් ද තහවුරු කිරීමට අවශ්‍යවන අන් කරුණු ද අභ්‍යන්තර නිවේදන පත්‍රිකාවේ පල කිරීමට ඕනෑම පාක්ෂික-යෙකුට හෝ පාක්ෂික මණ්ඩලයකට හෝ අයිතිවාසිකම් තිබේ,

(33) යම් පාක්ෂිකයෙක් පක්ෂයේ තීරණවලට හෝ පක්ෂයේ ක්‍රිය මාර්ගයට හා එහි ක්‍රියා කලාපයට හෝ පටහැනි අදහස් ද, මත ද, පක්ෂයෙන් බැහැර පල කෙරේ නම් ඒ පාක්ෂිකයා පක්ෂයේ විනය බරපතල අන්දමින් කඩ කිරීමට වැරදි කරුවෙක් වේ.

(34) <u>කණ්ඩායම්:-</u>

කිසියම් විවාදාත්මක ප්‍රශ්නයක් පිළිබඳ කණ්ඩායමක් තැනීමට යම්පාක්ෂිකයන් පිරිසක් කැමති වෙත් නම් එබඳු කණ්ඩායමක් සෑදීමට, ඔවුන් මධ්‍යම කාරක සභාවෙන් අවසර ගත යුතුය. එබඳු අවසරයක් දීමේදී අවශ්‍ය අණපනත් හා කොන්දේසි එයට දීමේ බලය මධ්‍යම කාරක සභාවට තිබේ.

(35) <u>විනයානුකූල ක්‍රියා:-</u>

යම් පාක්ෂිකයෙක් පක්ෂයේ විනය කඩ කරන ලද්දේ යයි මධ්‍යම කාරක සභාවට පැහැදිලි වුනොත් හැම ඒ හැම අවස්ථාවක දීම ඔහුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ. ඒ දඬුවම සාමාජිකත්වය තාවකාලිකව තහර කිරීම හෝ ස්ථිර සාමාජිකයෙකු අපේක්ෂකයෙකු බවට පත් කිරීමට හෝ පක්ෂයෙන් මුළුමනින්ම අස් කිරීම හෝ විය හැකිය.

(36) පාක්ෂිකයන් අතර විනය කඩ කරන ලද හැම අවස්ථාවක්ම ඒ ඒ ලෝකල් සභා විසින් හෝ ප්‍රාදේශිය මණ්ඩලයක් විසින් හෝ විනයානුකූල දඬුවම් ලබාදීම් වස් මධ්‍යම කාරක සභාව වෙත වාර්තා කෙරිය යුතුය.

(37) පක්ෂයේ යම් සංවිධානයක් පක්ෂයේ විනය කඩ කරන ලද්දේ යයි මධ්‍යම කාරක සභාවට පැහැදිලි වුනොත්නම් ඒ හැම විටකම එම සංවිධානය විසුරුවා හැරීමට හෝ විනය රැක ගැනීම සඳහා එහි ආකෘතිය වෙනස් කිරීමට හෝ මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

(38) පක්ෂයෙන් නෙරපීම් සහගත විනයානුකූලව දඬුවම් පමුණුවන ලද හැම අවස්ථාවක්ම මධ්‍යම කාරක සභාව විසින් ඉන්පසු ලඟම පැමිණෙන සාමාන්‍ය සම්මේලනයට දැන්විය යුතුය.

(39) <u>ව්‍යවස්ථා සංශෝධනය:-</u>

මේ ව්‍යවස්ථාව සංශෝධනය කළ හැක්කේ පක්ෂයේ සම්මේලනයක තීරණය පිට පමණය.

සැ.යු: අංක 4 සාමාජිකත්වයේ කොන්දේසි යන හිසින් පළමුවන කොටසේ (iv) දරණ වගන්තිය බලපවත්වන්නේ නැත.

මහාචාර්ය තිස්ස විතාරණ
ප්‍රධාන ලේකම්

ලංකා සමසමාජ පක්ෂය
457, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මා…
කොළඹ 02.

2015/9/11